

# වනදිවි ගීතයේ ලලිත්ගේ පදමාලාව

■ ලාල් හැගොඩ

ඩිජිටල් ඡායාරූපකරණයේ සම්ප්‍රාප්තියෙන් පසු ලෝක ඡායාරූපකරණය නොසිතූ විරූ යෝධ පිම්මක් පැන්නේය. ඡායාරූප ශිල්පීන් සියයට දහස් ගණනින් වර්ධනය විය. ඡායාරූප ශිල්පය සම්බන්ධයෙන් මෙම ප්‍රවණතාවයට ශ්‍රී ලංකාව හසුවී නොසිටින්නේ කෙසේද?

ඩිජිටල් ඡායාරූපකරණයේ ආගමනය ශ්‍රී ලංකාවට දනුණු පැහැදිලි ක්ෂේත්‍ර දෙකක් වන්නේ මංගල හා වනජීවී ඡායාරූපකරණයන්ය. මංගල ඡායාරූපකරණය හැරුණු කොට ලංකාවේ වඩාත් ප්‍රචලිත ඡායාරූප අංශය වන්නේ වන ජීවී ඡායාරූපකරණයයි.

මංගල ඡායාරූපකරණය හා සසඳන විට, වනජීවී ඡායාරූපකරණය ආදායම් ලබන්නේ ඉතා මද වශයෙනි. එබැවින් වනජීවී ඡායාරූපකරණයට පිවිසෙන්නා වනයටද කැමරාවටද එකසේ ආදරය කරන්නෙකු බව පැහැදිලිය.

අද ලංකාවේ ඉහළ මිල කැමරාද, කාචද, අනිකුත් උපකරණ ද භාවිත කරන්නේ වනජීවී ඡායාරූප ශිල්පීන්ය. මේ සඳහා විශාල කාලයක් කැප කිරීමට සිදු වේ.අද දවසේ කාලය ද මුදල්ය.

මෙම පසුබිම යටතේ වනජීවී ඡායාරූපකරණයට තෝතැන්නක් වූ සර්මකලාපීය අප රටේත් වනජීවී ඡායාරූප ශිල්පීන් බිහිවන්නට පටන් ගත්තේය.

යාල හෝ විල්පත්තු අභය භූමියට විනෝද ගමන් යන කණ්ඩායමක කිහිපදෙනෙක් අත අර්ධ වෘත්තීය මට්ටමේ කැමරා තිබේ. ඔවුන් වන සතුන්ගේ ඡායාරූප ගැනීම සුලබ දෙයකි. නමුත් වනජීවී ඡායාරූප යැයි කියන්නේ එසේ ගත් අලියා, කොටියා, මුවා, මීමින්නාගේ ඡායාරූපවලට නොවේ.

නූතන වනජීවී ඡායාරූප යනු සතුන්ගේ ක්‍රියාකාරකම් උන්ගේ චර්යාවන් හා සමහර විට ඔවුන්ගේ සිතැඟි පිළිබිඹු කරන ඡායාරූපයි. මිනිස් සංස්කෘතියට නතු නොවූ වනයේ හරිතමය ලොව ද වනජීවී ඡායාරූප නම් විෂයට අදාළ වේ.

වනසත්ව ඡායාරූප තරමට, සතුන් ජීවත්වන, උන් පෝෂණය කරන, රැකබලා ගන්නා, උන්ට ආශ්වාද ජනක වූ හරිත ලොව ද වනජීවී ඡායාරූප යන විෂයට අදාළ වේ. මෙම හරිත ලොව අද වනජීවී ඡායාරූප ශිල්පීන්ගේ අවධානයට හසුවන්නේ නැති තරම්ය. ලලිත්ගේ ඡායාරූප අතර මෙවන් ඡායාරූප කිහිපයක් හෝ දක්නට ලැබීම වාසනාවකි.

ඊටත් වඩා වනජීවී ශිල්පියෙකු වශයෙන් ලලිත් අප ගෞරවයට පාත්‍රවන්නේ ඔහු වනයේ සැබෑ ආදරවන්තයකු වන බැවිනි. සැබෑ ආදරවන්තයකුගේ ස්වභාවය ඔබ මට වඩා හොඳින් දනී. ආදරය ප්‍රකාශ කිරීම පහසු දෙයකි. "මම ඔයාට ආදරෙයි" වදන් තුළ සැබෑ ආදරය නැත. සැබෑ ආදරවන්තයාගේ ආදරය සිතේ දිදුළයි. තෙරපෙයි, සුන්දර පීඩනයක් ගෙනෙයි. අවසානයේ එය ඔහුගේ පන්හිඳ ඔස්සේ ගලා එයි. එය ලොව ආදරවන්තයන්ගේ පොදු ස්වභාවයයි.

මෙම ග්‍රන්ථයෙන් හඳුනාගත් පරිදි ලලිත් ද කවියෙකු වෙයි. සෑම ඡායාරූපයක් වෙනුවෙන්ම ඔහු තම කවි සිත පුබුදුවන සැටි සිත් ගන්නා සුළුය. අහස්කුස රජ කරන විශාල උකුස්සෙකුගේ පැහැදිලි මනහර ඡායාරූපයක් පිළිබඳ ඔහු තම කවි සිත අවදි කරන්නේ මෙසේය.

"යාව යාව ඇති තුරු හිස් වියන් මතින්

පාව පාව යන අඹරේ වලා යටින්

භාවනාවකට සමවැදි අයෙකු ලෙසින්

පාව පාව යම් නිම්තෙර දකින ලෙසින්"

කුරුලු බිත්තර දෙකකින් එකක් පිපිරී පැටවකු බිහිවේ. තවමත් නොපිපිරුණු බිත්තරය දෙස බලමින් බිහි වූ පැටියා මෙසේ කියයි.

"ඇයි පමා

තනිකම නිවා

බිහිවන්න දැන්වත්

සොහොයුරා"

සැබෑ වනජීවී ඡායාරූප ශිල්පියා කොහොමටත් කවියෙකි. ඡායාරූප කවිය පසු කර සාහිත්‍යමය කවියක් මා දකින්නේ පළමුවරට ලලිත්ගේ 'වන දිවි වරුණ' ග්‍රන්ථයෙනි.



ග්‍රන්ථයේ පිටකවරය සරසන නැෂනල් ජෙයාග්‍රැෆි (National Geography) සඟරාවේ අවධානය දිනාගත් කොටියාගේ පිම්ම (පූමා) දුලබ ගණයේ ඡායාරූපයකි. මෙහිදී හරිත පරිසරයත්, සතාගේ ක්‍රියාකාරීත්වයේ තීරණාත්මක මොහොතකුත් සටහන් කරගැනීමට ලලිත්ගේ සිතත්, ඇසත්, අතත්, ඇඟිල්ලත් එකවර ක්‍රියාකර තිබීම අපූරුය. 'කොටියාගේ පිම්ම' ගැන රියර් අද්මිරාල් ලලිත් ඒකනායකගේ වෘත්තීය උකුසු ඇස සමඟ මේ ඡායාරූපය පටලවා ගත යුතු නැත. ලලිත් නොසෙල්වී නිහඬව සිට කුරුමානම අල්ලා කැමරා තුවක්කුවේ කොකා නිවැරැදි මොහොතේ ක්‍රියාත්මක කර ඇති බව පැහැදිලිය.

සියලුම ඡායාරූප අතරින් මා කැමතිම ඡායාරූපය පිළිබඳ පළමුවෙන් ලියන්නට කැමැත්තෙමි. හිම වලසා සහ පිණි මුවා දැක ඇති අපට පිණි වලසා මුණ ගැසී නැත. 99 වැනි පිටේ පළව ඇති ලලිත්ගේ 'පිණි වලසා' ඡායාරූපය ඉතාමත් සිත් ගන්නා ඡායාරූපයක් බව අපගේ හැඟීමයි. මෙම ඡායාරූපයේ ඇත්තේ අලුයම වලසෙක් තම ඇඟේ තැවරුණු පින්න ගසා දමන අවස්ථාවයි. වලසා කොටියා තරමට පෙනෙන්ට සිටින සතෙක් නොවේ. උදෑසන පිණි තැවරුණ වලසා ලෙහෙසියෙන් හමුවන්නේ නැත. කැමරාවේ දර්ශන තලයට එළඹීමත් ඇඟ සොලවා පිණි ගසා දැමීමත් අතිශය දුලබ දසුනකි. වලසාගේ කළු සමට ඉදිරියෙන් පිණි විසිවන නිසා ඒවා අපට පැහැදිලිව පෙනේ. මෙම අවස්ථාව ඡායාරූපයට නඟා ගැනීමට  හැකි වීම ලලිත්ගේ වාසනාවකි. ඡායාරූපය දැක ගන්නට ලැබීම අපේ වාසනාවකි. මෙහිදී නවීන තාක්ෂණයේ බලපෑම මතුවන අතර, කාචයේ දියුණුකමද, නාභිගත වීමද, ලලිත්ගේ මොහොත තෝරා ගැනීමද එකිනෙකට මනාව සංයෝග වී තිබේ.



27 වැනි පිටේ පළවන ඇත් පවුර නම්, මින්නේරිය වැව ආසන්නයේ ගත් ඡායාරූපය අපට රුවන්වැලි සෑය වටා ඇති ඇත් පවුර සිහිගන්වයි. අලින් සියදෙනෙක් පමණ එකම රේඛාවක් දිගේ කවුරු හෝ සකස් කළා වාගේ කෙළින් සිටගෙන සිටින අන්දම අදහා ගැනීමටත් අපහසුය. මෙහිද වඩා වැදගත් ඡායාරූපමය පියවර වන්නේ තනි ඡායාරූපයකින් ගත නොහැකි මෙම ඡායාරූපය සඳහා නව ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගෙන ඇති අන්දමයි. අප රටේ වනජීවී සම්පත ගැන, ඕනෑම රටකදී ඉදිරිපත් කිරීමට මෙය නම් කදිම ඡායාරූපයකි.



මෙවන් ඡායාරූප බොහොමයක් මෙම ග්‍රන්ථයේ අඩංගු වේ. හඳුන් දිවියා (පිට 11), මීන් පෙරහර (පිට 17), උදාර අපේක්ෂා (පිට 29), ගැටුම් (පිට 43), මකර නැටුම් අවදානම හා රැකවරණය (පිට 56), ප්‍රතිපක්ෂ (පිට 09), අවසන් හුස්ම (පිට 128) අප සිත දිනා ගත් ඡායාරූපවලින් කිහිපයකි.

යාල හා විල්පත්තු විනෝද ගමන් යන්නෝ ඕනෑ තරම් කොටින්ගේ ඡායාරූප ගෙන එති. අද පවුලේ ඡායාරූප ඇල්බමයක එසේ ඡායාරූපයකට නැඟූ කොටියෙක් දෙන්නෙක් සිටීම අරුමයක් නොවේ.

නමුත් 'වන දිවි වරුණ' ග්‍රන්ථයේ ඇති කොටින්ගේ ඡායාරූප පහළොව, විස්සම එකක් නැර ලෝකයේ ඕනෑම වනජීවී ඡායාරූප ප්‍රදර්ශනයක ප්‍රමුඛ තැනක් ගනු ඇත.

ඩිජිටල් කැමරාවකින් ගත් ඡායාරූපයක දීප්තිය, වර්ණය මෙන්ම අනාවරණ නිවැරැදි කිරීම සඳහා පසු පිරියම් (Post Processing) කිරීම බොහෝ විට අවශ්‍ය වෙයි. එය ලොව පිළිගත් ක්‍රමවේදයකි. නමුත් එය ප්‍රමාණය නොඉක්මවා නොකිරීමට ඡායාරූප ශිල්පියා වගබලා ගත යුතුය. නිවැරැදිව පසු පිරියම් නොකළේ නම් පළපුරුදු ඇස එය පහසුවෙන් හඳුනා ගනී. ඡායාරූපයේ අගය අඩුවේ.

මෙම ග්‍රන්ථයේ ඇති සමහර ඡායාරූප එසේ පමණ ඉක්මවා වැඩි දියුණු කර තිබීම ගැන මම පුදුමයට පත් වූයෙමි. ඒ ගැන ලලිත්ගෙන් විමසුවෙමි. එය මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ දී සිංගප්පූරුවේ මුද්‍රණකරු අතින් සිදු වූ දෙයක් බව ලලිත් පැහැදිලි කළේය.

ඉදිරි කටයුතුවලදී මෙවන් වැරදි සිදු නොවීමට ලලිත් වගබලා ගත යුතුය. පසු පිරියම් පිළිබඳවත් මුද්‍රණය පිළිබඳවත් පළපුරුදු අයගේ සහාය ලබා ගැනීමට උනන්දු විය යුතුය.

වනයේ සැබෑ ආදරවන්තයාට වනය තම නිවහන වේ. වනයේදී හමුවන කිරිල්ලියක් හා පැටවුන් දකිනා විට තම බිරිඳත් දරුවනුත් සිහියට එන්නේ ඒ ආදරවන්ත කවියාටය.

කිරිල්ලියකත්, පැටවුන් දෙදෙනකුත් වනයේදී දකිනා විට රසන්ජලීත්, ලිහිණිත්, නිල්මිත් මතක් වන්නේ එබැවිනි.

ලිහිණියා නව කැදැල්ලක් තනාගෙන මාපිය කැදැල්ලෙන් නික්ම ගොසිනි. කවි ලෝකයේ වුවද ලොව යතාර්ථය දන්න ලලිත් ලිහිණියාට කැදැල්ලත් රැගෙන 'නැවත එන්න පියඹලා දුවේ' කියන්නේ නැත.

ශ්‍රී ලංකාවේ වනජීවී ඡායාරූපකරණයේ  ප්‍රමුඛයන් අතර ලලිත් ඒකනායකට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. ඔහු වෘත්තියෙන් රියර් අද්මිරාල්ය. නාවික හමුදාවේ මෙම නිල තත්වයට අප නොමඳව ගරු සැලකිලි කළත් අපිට ඔහු වනජීවී ඡායාරූප ශිල්පී ලලිත්ය.

වනජීවී ඡායාරූපකරණය සඳහා පළපුරුද්ද හා සාර්ථකත්වය කියාපාන්නා වූ 'ඇනිමල් වර්සස්' නම් ප්‍රදර්ශනය පසුගිය මැයි මාසයේ දී කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී පැවැත් විණ. මේ සටහන ඔහුගේ සිරිලක නොදිසි වන අසිරිය 'වන දිවි වරුණ' නමින් ප්‍රකාශයට පත් වූ විශාල ඡායාරූප 150කින් අලංකාර වූ මහඟු ග්‍රන්ථය වෙනුවෙනි.